# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## කොන්ත්‍රාත් පදනම මත රියදුරු තනතුර

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින රියදුරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :**

(I). අට වෙනි ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

(II). බර වාහන හා ලොරි පැදවීම සම්බන්ධව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් තිබිය යුතුය.

(III). රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව යටත් පිරිසෙයින් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(IV). වාහනයේ සුළු අළුත් වැඩියාවක් කර ගැනීමට හැකියාවක් තිබිය යුතුය.

(V). අවම උස අඩි 05 අඟල් 2 ½ ක් විය යුතුය.

(VI). මාර්ග සංඥා සහ මෝටර් රථ ආඥා පනතේ මාර්ග නීති සම්බන්ධව මනා දැනුමක් ලබා තිබිය යුතුය.

(VII). දිවා රාත්‍රී සේවය සඳහා සුදුසු මනා ශරීර සෞඛ්‍ය තත්වයක් හා ඇස් පෙනීමකින් යුක්ත විය යුතුය.

**වැටුප** : රු. 50,000.00 (සියලු දීමනා ඇතුළත්)

**වයස** : අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**ප්‍රතිලාභ** : තෝරා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 8% ක ප්‍රමාණයක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් 12% කට සමාන ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට ගෙවනු ඇත. ඊට අමතරව ඔවුන්ගේ ස්ථාවර මාසික දීමනාවෙන් 3% ක ප්‍රමාණයක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවනු ඇත.

**සටහන** :

- රියදුරු තනතුරේ වැඩි පළපුරුද්දක් ඇති සහ නාවල විවෘත විශ්වවිද්‍යාලයේ සිට කිලෝ මීටර් 10 ක් තුළ පදිංචි අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
- 2023.09.27 දින පල කරන ලද දැන්වීමට අනුව මෙම තනතුර සඳහා අයදුම් කළ අය නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

**අයදුම් කළ යුතු ආකාරය :**

තමන් විසින් සකස් කරන ලද සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් අයදුම්පතක් සහතිකවල පිටපත් ද සමඟ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ යන ලිපිනයට 2023.12.12 දිනට පෙර ලැබෙන සේ තැපැල් මඟින් එවීමට හෝ පැමිණ භාරදීමට හැකිය. සහතිකවල පිටපත් සමඟ 2023.12.12 දිනට පෙර එවනු ලබන අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා සලකා බලනු ලැබේ.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ
2023.11.29